


කොළඹ ආනන්ද විද්‍යාලය පසුගිය දා එකසිය විසි වැනි වියට පා තැබුවා... නොවැම්බර් පලවෙනිදාට යෙදී තිබුණ විද්‍යාලයීය ආදි කර්තෘ දිනය වික්ටෝරියානු ආදි ශිෂ්‍යයන් විසින් ද බෞද්ධාගමික පිළිවෙත් අනුව සමරනු ලැබුවා.. පන්හිඳ හෙමිහිට දිනපොතේ සටහනක් ලිව්වා.

අනුන්ගේ ඩයරි වලට එබෙන එක නම් හරි වැඩක් නෙවෙයි මල්ලී.. දිනපොතේ සමහනට එබිකම් කරන පින්සලට පන්හිඳ කිව්වා

අතිශයින්ම පෞද්ගලික දෙයකුත් නෙවෙයි ලියලා තියෙන්නෙ... ආනන්දය විතරක් නෙවෙයි ලංකාවේ මිෂනාරි ආගම පැතිරිලා තිබුණ කාලයක පටන් ගත්ත බෞද්ධ විද්‍යාලවලින් රදා මෙදා තුර මව් රටට ලොකයට දායාද වුණ මිනිස් සම්පත් ගැන කල්පනා කලොත් ඒ විද්‍යාල මුළු ජාතියටම පොදු වුණ වස්තු නොවේදැයි පින්ට මොහොතකට හිතුණා.

අපේ කම ගැන හිතන්න පුලුවන් හිත් හදන එක තමයි අ3මාරුම දේ.. මේ රටේ උන්නා වුණත් පුලු පුලුවන් වෙලාවට අපේ තැන්වලදී වත් අපේ දේවල් ඉස්සරහට ගන්න උනන්දු වෙනවා නම් මොන තරම් වටිනවාද? පන් කිව්වෙ බොහෝම හැඟීම් බර ව.

ඉතිහාසයෙන් ගන්න පාඩම් ඕනෙ තරම්.. මිෂනාරි බලවේග තියෙන අතරේ බෞද්ධයින් විතරක් නෙවෙයි හින්දු මුස්ලිම් ආගම් අදහන අයත් හරි හරියට එක් වුණා.. තමන්ගෙ කමට ආයෙත් පණ පොවන්න.. පින් කිව්වා.

නීල් ආම්ස්ට්‍රෝං හඳේ පය ගැහුවේ තනියම නෙවේ.. පන් පුරුදු පදේ ගැහුවා. .. ගැලීලියෝ කන්නාඩියෙන් දුර බලපු දා ඉඳන් පැවතගෙන ආ හැමෝම නිසා...

# අපේම පොදු තැනක්



සිසිර දිසානායක

රුසියන් ජාතික පෙට්‍රෝව්නා බ්ලැවට්ස්කි මැතිණිය සමඟින් ගාලු වරායට ගොඩ බට ඕල්කට් තුමා ගාල්ලේ විජයානන්ද පිරිවෙණ නමින් හැඳින්වෙන වැලිවත්තේ විහාරයේ දී පන්සිල් සමාදන්ව බෞද්ධාගම වැළඳ ගත්තේ ය. අනතුරුව කොළඹට පැමිණ පැවැත් වූ ගිහි පැවිදි සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් 1880.06.17 දින කොළඹ බෞද්ධ පරම විඥානාර්ථ සමාගම පිහිටුවා ගන්නා ලද්දේ නිව්යෝර්ක් නගරයේ දී තමා ඇරඹූ සංගමයේ අරමුණු තව දුරටත් ඉදිරියට ගෙන යාමේ අපේක්ෂවෙනි.

ඔය හැම දේකටම හොඳ අඩිතාලමක් දාන්න පුලුවන් තැන තමයි ඉස්කෝලය. පාසල කියන්නෙ රටක ජාතියක අනාගතය.. ඊනිසා අපි පරණ කතාවල් ගැන ලියමුද ටිකක්..? පින් යෝජනා කළා.

ඔය කිව්වට ඉතාහාසය නිකම්ම ලියන්න පුලුවන් ද? ආනන්දයේ ආචාර්ය වරයෙකු සහ ආදි ශිෂ්‍යයෙකු වූ රන්ජිත් සොයිසා මහත්මයා දුන්න දයානන්ද ගුණවර්ධන ශූරීන්ගේ ආනන්ද ජවනිකා පොත පන්ගේ සිහියට ආවෙ හොඳ වෙලාවට.



ක්‍රිව 1869 දී දොඩන්දූවේ දෙහිගල්ලේ දී ලෝකාර්ථ සාධක සංගමයේ මූලිකත්වයෙන් පූජ්‍ය දොඩන්දූවේ ජිනරතන තිස්ස මහ නාහිමි පිහිටවා ලූ බෞද්ධ පාසල මේ සම්බන්ධයෙන් වැදගත් වේ. ක්‍රිව 1880 ජීනි මස 17 වන දින ශ්‍රී ලංකාවට පැමිණී සෙන්පති හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ඇරඹූ බෞද්ධ පාසල් පිහිටුවීමේ ව්‍යාපාරයට පෙර පටන් පන්සල් ආශ්‍රිතව වූ පාසල් පිළිබඳව අප හට මුලින්ම අසන්නට ලැබෙන්නේ ඉහත කී පාසල නිසාවෙනි ඒ.

නොයෙකුත් ආගමික මතවාදයන් එල්ල කොටගෙන එකල ප්‍රසිද්ධියේ පැවැත් වූ වාදයන් බොදු ජනයා පුබුදුවා ලීමට මහත් සේ උබකාරී විය. නිර්වාන වාදය, විෂ්ණු වාදය, දේව පූජා වාදය, මහණ රවුළු වාදය වැනි ඇදහිලි හා පැවතුම් මුල් කොට ගත් වාද එනමින් හැඳින්වුණ අතර කඩවත වාදය, බද්දේගම වාදය, වරාගොඩ වාදය වැනි වාද ඒවා පැවැත්වීමට යෙදුණා වූ ස්ථාන අනුව නම් කෙරිණි. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් මුල් වී පැවත්වුණ පානදුරා වාදය මේ අතරින් විදෙස් රටවල පවා බොදු හිතකාමීන් අතරේ ආන්දෝලනයට ලක් වූ වාදයක් විය.

ක්‍රිව 1860 දී පමණ ඇරඹුණ ලංකෝපකාර මුද්‍රණාලය ලංකාලෝකය සහ වෙනත් බෞද්ධ පොත් පත් පත්‍රිකා මුද්‍රණය කළ මුද්‍රණාලය විය. පානදුරා වාදය පිළිබඳව මෙම මුද්‍රණාලය මගින් නිකුත් වූ පත්‍රිකාවක් එකල ලංකාවේ ම විසූ ක්‍රිස්තියානි ප්‍රභූවරයකු වූ එඩ්වඩ් පෙරේරා වියතාණන් අතින් ඉංග්‍රීසියට පරිවර්තනය වී තිබිණ. එවන් පරිවර්තනයක් කියැවීමෙන් ය සෙන්පති හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා බෞද්ධ දර්ශණය පිළිබඳව විමසිලිමත් වූයේ 1633 දී එංගලන්තයේ සිදුවූ ආගමික පීඩනය නිසා අමෙරිකාවට ගියා වූ පියුරිටන් පවුලකින් වසර 1832 අගොස්තු මස 2 දා උපන් එතුමා 1860 දී දේව ධර්මාචාර්ය රිචල් මෝගන් ගේ දියණිය හා විවාහ වූයේ ය. 1879.01.11 වන දින නිව්යෝර්ක් නගරයේ එතුමන් ආරම්භ කිරීමට යෙදුණ පරම විඥානාර්ථ සංගමයේ ප්‍රධාන පරමාර්ථය වූයේ වර්ණ භේද ජාති භේද, කුල භේද හා ආගම් භේද නොසලකීම, සෑම ආගමක්ම සෑම නිකායක්ම ප්‍රගුණ කිරීම සහ ස්වභාවධර්මය සහ මනුෂ්‍යයාගේ අභ්‍යන්තර කරුණු ගවේෂනය යි.

ඕල්කට් තුමා ගේ පුරෝගාමීත්වයෙන් යුත් එකී සංගමයේ පරමාර්ථ බෞද්ධ දර්ශනයට සමගාමී වූ නිසාවෙන් ද පානදුරා වාදය පිළිබඳව කියවා ලත් පිබිදීමෙන් ද යුතුව වසර 1878 සිට ගරු දොඩන්දූවේ සිරි පියරතනතිස්ස හිමි (1826 - 1907) සමඟින් කළා වූ ලිපි ගනුදෙදුවේ ප්‍රතිඵලයයි එතුමාගේ ලංකාවප්‍රාප්තිය.

රුසියන් ජාතික පෙට්‍රෝව්නා බ්ලැවට්ස්කි මැතිණිය සමඟින් ගාලු වරායට ගොඩ බට ඕල්කට් තුමා ගාල්ලේ විජයානන්ද පිරිවෙණ නමින් හැඳින්වෙන වැලිවත්තේ විහාරයේ දී පන්සිල් සමාදන්ව බෞද්ධාගම වැළඳ ගත්තේ ය. අනතුරුව කොළඹට පැමිණ පැවැත් වූ ගිහි පැවිදි සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් 1880.06.17 දින කොළඹ බෞද්ධ පරම විඥානාර්ථ සමාගම පිහිටුවා ගන්නා ලද්දේ නිව්යෝර්ක් නගරයේ දී තමා ඇරඹූ සංගමයේ අරමුණු තව දුරටත් ඉදිරියට ගෙන යාමේ අපේක්ෂවෙනි. එවකට ලංකාලොකය පත්‍රයේ කටයුතු වල යෙදෙමින් සිටියා වූ ත් 1869 දී ශ්‍රී පාදස්තාන නායක පදවියෙන් පිදුම් ලද්දා වූත් 1873 දී මාලිගාකන්ද විද්‍යොදය පිරිවෙණ ආරම්භ කළා වූත් මෑත අතීතයේ විසූ ශ්‍රේෂ්ඨතම පඬිරුවනක මෙන්ම ජාතික ප්‍රබෝධය උදෙසා මහඟු සේවයක් කළ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණන් වහන්සේ බෞද්ධ පරමවිඥාකාර්ථ සමාගම පිහිටුවීමෙහි ලා පුරෝගාමී දායකත්වයක් ගත් සේ ක.

මුලින් කී පරිදි පූජ්‍ය දොඩංදූවේ පියරතන තිස්ස හිමි ඇරඹූ බෞද්ධ පාසල් පිහිටුවීමේ අදහස වඩාත් සංවිධානාත්මකව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යත.ාව හොඳින් වටහා ගත් ඕල්කට් තුමා පරමවිඥානාර්ථ සමාගමේ ද අනුබලය ලබමින් ඇරඹූ බෞද්ධ බෞද්ධ පාසල් පිහිටුවීමේ ව්‍යාපාරය වෙනුවෙන් කැප වූයේ බෞද්ධයින් ම පමණක් නොවේ. පොන්නම්බලම් රාමනාදන් ආනන්ද කුමාරස්වාමි වැනි ද්‍රවිඩ ජාතික වියතුන් ද නිදහස් සටනේ නාමයෙන් පසු බිමෙහි සිටි අතර ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා ගේ බොදු සිත් පුබුදුවාලීමේ ව්‍යාපාරයන් ද අවශ්‍ය වටපිටාව මැනැවින් සකස් කර දුන් බව අමතක කළ යුතු නොවේ. ආනන්දයේ මුල්ම විදුහල්පති වරයා වූ වෙල්ස් ජාතික සී ඩබ්ලිව් ලෙඩ් බීටර් මහතා එංගලන්ත සභාවේ පූජක වරයකු විය. මියුසියස් විද්‍යාලයට ඒ නම ලැබුයේ ජර්මානු ජාතික මාරි මියුසියස් හිගින්ස් මැතිණියගේ කැප වීම හේතුවෙන් මය.

1881 පෙබරවාරි මස අග භාගයේ ඉරිදා ඉංග්‍රීසි පාසලක් වශයෙන් පිටකොටුවේ මාලිගාවත්ත වීදියේ ඇරැඹි බෞද්ධ පාසල ඔල්කට් ආගමනයෙන් පසුව දියත් කළ ව්‍යාපාරය නිසාවෙන් 1886 නොවැම්බර් පළමුවෙනිදා සිට දිනපතා පාසලක් වශයෙන් ආනන්ද විද්‍යාලය නමින් යළි නව පණ ලැබුවේ මරදාන පරණවාඩියේ වර්තමාන භූමි භාගයේ අඩි 180-34 ප්‍රමාණයේ අලුතින් ඉදි වූ ශාලාවක ය. සීතාවක රාජසිංහ රජ විරුවාණන් කොටුවට

